# උත්ථාන සමයේ දෙවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය ක්‍රියා 2: 42–47

*අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.*

සැදැහැවත් සියල්ලෝ එකතුවී සැමදෙයම පොදුවේ තබාගත්හ.

ඔව්හු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද, සහභාගිකමෙහි ද රොටි කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරත ව කල් ගත කළහ. සියලු දෙනා තුළ ගෞරවාන්විත භීතියක් ඇති විය. ප්‍රේරිතවරුන් අතින් බොහෝ අරුමපුදුම දේ හා ලකුණු සිදු විය. ඇදහිලිවතුන් සියල්ලෝ එක් වී හැම දෙය ම පොදුවේ තබාගත්හ. ඔව්හු තමන්ගේ ඉඩකඩම් හා දේපළ විකුණා එකිනෙකාගේ වුවමනාවේ හැටියට සියලු දෙනා අතර බෙදාගත්හ. තවද, ඔව්හු දිනපතා නොකඩ ව ම, එක්සිත් ව දේව මාලිගාවේ රැස් වෙමින් ද ගෙයින් ගෙට යමින් රොටි කඩමින් ද තම තමන් අතර ප්‍රීතියෙනුත්, ත්‍යාගිවන්ත සිතිනුත් ආහාර බෙදාගනිමින් ද දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් හා සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ද කල් යැවූ හ. සමිඳාණන් වහන්සේ ගැළැවීම ලබන්නන්ගේ ගණන දවසින් දවස වැඩිකර වදාළ සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 118: 2–4, 13–15, 22–24

පිළිතුර: සමිඳුන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේය.
එතුමන්ට තුති පුදන්න. ආලේලූයා. ආලේලූයා.

ගීය : “සමිඳුන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ ය”යි
ඉශ්රායෙල් දැන් කියත් වා!
“එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ ය”යි
ආරොන්ගේ වංශය දැන් කියත් වා!
“සමිඳුන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ ය”යි
එතුමන් කෙරෙහි ගරුබිය ඇත්තෝ දැන් කියත් වා!

වැටෙන පිණිස මම තදින් තල්ලු කරන ලදිමි:
එහෙත් සමිඳාණෝ මට පිහිට වූ සේක.
සමිඳාණෝ මාගේ සවිය ද ගීය ද වෙති:
එතුමාණෝ මාගේ ගැළැවුම්කාරයාණෝ ය.
ප්‍රීතිවීමේ හා ගැළැවීමේ හඬට සවන් දෙන්න.
දමිටුන්ගේ කුඩාරම්වල ජය නාදය ඇසේ.
සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි.

ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම මුල් ගල වී ඇත.
මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි: එය අපේ දෙනෙතට අසිරිමත් ය.
මෙන්න, සමිඳුන්ගේ ජය මංගල දිනය!
මෙදින අපි ප්‍රීති වෙමු: සන්තෝෂ වමු.

## දෙවන දේව ප්‍රකාශනය 1 පේදුරු 1: 3-9

*ශුද්ධ වූ පේදුරු තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය මගින් දෙවියන් වහන්සේ අපට නව ජීවනයක් දී ජීවමාන බලාපොරොත්තුවක් උදා කළ සේක.

අපගේ ස්වාමීන් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පියාණන් වන දෙවියන් වහන්සේට ප්‍රශංසා වේ වා! ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මරණින් උත්ථාන කිරීම හේතුකොටගෙන, දෙවියන් වහන්සේ ස්වකීය මහත් දයාවෙන්, අපට නව ජීවනයක් දී, අපට ජීවමාන බලාපොරොත්තුවක් උදා කළ සේක. ඒ බලාපොරොත්තුව වනාහි සදහට ම පවත්නා උරුමයකට අප හිමිකාරයන් වීම ය. අජරාමර වූ ද, නොමැලවෙන්නා වූ ද, ඒ උරුමය ස්වර්ගයෙහි ඔබ උදෙසා තබා ඇත. දෙවියන් වහන්සේගේ විමුක්තිදායක අරමුණ එළිදරව් කරන්නට යන අන්තිම කාලය දක්වා, ඔබගේ ඇදහිල්ල නිසා දෙවියන් වහන්සේගේ බලය කරණකොටගෙන ඔබ ආරක්ෂා කරනු ලබන්නහු ය. ඔබ තව ස්වල්ප කලකට විවිධාකාර පරීක්ෂා වලින් පීඩාකරනු ලැබිය යුතු වුව ද, ඒ විමුක්තිය ගැන ඔබ ඉතා ප්‍රීති වන්නහු ය. එසේ පීඩාකරනු ලබන්නේ, ඔබේ ඇදහිල්ල සෝදිසි කිරීමයට ය. ගින්නෙන් පරීක්ෂා කරනු ලබන, විනාශ වන රනටත් වඩා අනර්ඝ ඔබේ ඇදහිල්ල, එසේ සෝදිසි කිරීමෙන් ජේසුස්

ක්‍රිස්තුන් වහන්සේගේ එළිදරව් වීමේ දී ප්‍රශංසාව ද, මහිමය ද, ගෞරවය ද ඔබට ලැබෙනු ඇත. ඔබ උන් වහන්සේ නුදුටු නමුත් උන් වහන්සේට ප්‍රේම කරන්නහු ය. දැන් ඔබ උන් වහන්සේ නොදකින නමුත්, උන් වහන්සේ අදහා,
ඔබගේ ඇදහිල්ලේ අරමුණ වන ඔබගේ ආත්ම ගැළවීම ලබමින්, කියා නිම කළ නොහැකි, තේජාන්විත මහා ප්‍රීතියකින් ප්‍රීති වන්නහු ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද — ජොහන් 20: 29

ආලේලූයා! ආලේලූයා!
“තෝමස්, ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහි ය.
නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ යැ”යි
ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය — ජොහන් 20: 19–31

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### උත්ථාන වූ ස්වාමින් වහන්සේ පැමිණ ශ්‍රාවකයන් මැද වැඩ සිටි සේක.

සතියේ පළමු වන දා වූ එදා සවස ජුදෙව්වරුන්ට බියෙන් ශ්‍රාවකයන් දොරවල් වසාගෙන සිටි තැනට ජේසුස් වහන්සේ වැඩම කර ඔවුන් මැද සිට, “ඔබට ශාන්තිය වේ වා!”යි වදාළ සේක. උන් වහන්සේ මෙසේ වදාරා තමන් අත් ද ඇළය ද ඔවුන්ට පෙන් වූ සේක. ශ්‍රාවකයෝ සමිඳාණන් වහන්සේ දුටු කළ ප්‍රීතියෙන් පිනා ගියහ. “ඔබට ශාන්තිය වේ වා!”යි යළිත් උන් වහන්සේ ඔවුන්ට වදාරා “පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි”යි ඔවුන්ට කී සේක. උන් වහන්සේ ඉක්බිති ඔවුන් පිට හුස්ම හෙළා, “ශුද්ධාත්මයාණන් පිළිගන්න: ඔබ යමෙකුගේ පව් කමා කරන්නහුද, ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ: ඔබ යමෙකුගේ පව් කමා නොකරන්නහු ද, ඒවා කමා නොකරනු ලැබේ ය”යි

ඔවුන්ට වදාළ සේක. ජේසුස් වහන්සේ වැඩිය කළ, දොළොස් දෙනාගෙන් එක්කෙනෙක් වූ 'තිවුන් දරුවා' යයි නම් ලත් තෝමස් ඔවුන් සමග නොසිටියේ ය. එහෙයින් සෙසු ශ්‍රාවකයෝ, "අපි සමිඳාණන් වහන්සේ දුටිමු" යි ඔහුට කී හ. එහෙත් ඔහු කතා කොට, "උන් වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක, ඇණ ගසා තිබූ තැන්වල මාගේ ඇඟිල්ල තබා, උන් වහන්සේගේ ඇළයෙහි මාගේ අත දමා බැලුවොත් මිස, නැත්නම් විශ්වාස නොකරමි"යි කී ය. අට දවසකට පසු උන් වහන්සේගේ ශ්‍රාවකයෝ නිවෙස තුළට වී සිටියෝ ය. තෝමස් ද ඔවුන් සමග සිටියේ ය. දොරවල් වසා තිබිණි. එහෙත් ජේසුස් වහන්සේ පැමිණ, ඔවුන් මැද වැඩ සිට: "ඔබට ශාන්තිය වේ වා!"යි වදාළ සේක. ඉන්පසු උන් වහන්සේ තෝමස් අමතා, "ඔබේ ඇඟිල්ල මෙහි බහා මාගේ අත් බලන්න: ඔබේ අත දිගුකර මාගේ ඇළයෙහි තබන්න. අවිශ්වාස නොකර විශ්වාස කරන්නැ"යි වදාළ සේක. තෝමස් පිළිතුරු දෙමින්, "මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි"යි උන් වහන්සේට කී ය. එවිට ජේසුස් වහන්සේ, "ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහි ය. නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය"යි වදාළ සේක.

මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් ඉදිරියෙහි සිදු කළ සේක. එහෙත් මේවා ලියන ලද්දේ, ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍ර වන ක්‍රිස්තුවරයාණන් බව ඔබ අදහාගන්නා පිණිසත්, ඇදහීමෙන් ජීවනය ලබන පිණිසත් ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*